**කෑගල්ල මහා නගර සභාව - 2023**
**-------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහා නගර සභා අඥා පනතේ (252 වන අධිකාරිය)2,3,5 සහ 9 වෙනි වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන අමාත්‍යවරයාගේ 2022 සැප්තැම්බර් 06 දිනැති අංක 2296/05 දරන ගැසට් නිවේදනය පරිදි 2023 මාර්තු 20 දින සංස්ථාපනය කරන ලද කෑගල්ල මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තතත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරිය) 219 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කෑගල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා  නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ  මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,  මහා නගර සභාව  ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි වියදම් රු1,606,678 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | උසාවි දඩ මුදල් ආදායම රු 296,750 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උසාවි දඩ ආදායම් ණය ගැතියෝ රු 326,750 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව. | ආදායම් ණයගැතියෝ නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | මුද්දර ගාස්තු ආදායම් ණයගැතියෝ රු. 19,941,754 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඒ ඒ වර්ෂයට අදාල මුද්දර ගාස්තු සම්බන්ධ විස්තර එම වර්ෂය තුලම නොලැබෙන අතර ප්‍රමාද වී ලැබීම නිසා අදාල වර්ෂයට ඇතුළත් කිරීමට නොහැකිවී ඇත. | - එම - |
| (ඉ) | සමාලෝචිත කාලපරිච්ඡේදය අවසානයට ජංගම නොවන වත්කම් වටිනාකම හා එදිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු 38,295,000 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල ප්‍රකාශ නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඊ) | අළුතින් සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී පහත සඳහන් ගැලපීම් කර නොතිබුණි. | | |
| (i) | ඉඩම් කට්ටිකර විකිණීමේදී සභාවට ලැබී තිබුණු රු.2,479,545 ක සියයට 1 ක්වූ බදු මුදල, මල් පෝච්චි පලුදු කිරීම වෙනුවෙන් අය කළ රු.294,943 ක දඩ මුදල්, මාර්ගය පලුදු කිරීම වෙනුවෙන් ලැබී තිබුණු රු.1,594,518 ක මුදල ආදායමට නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම නිසා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව. | - එම - |
| (ii) | ඉකුත් වර්ෂ 02 ක ස්ථාවර වත්කම් වැඩිදියුණු කිරීම සඳහා දරන ලද එකතුව රු.40,386,382 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |

### 1.5.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත කාල පරිච්ඡේදය අවසානයට පොදු ගබඩා ගිණුමෙහි මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය, උපලේඛන සමඟ සැසඳීමේදී රු.8,101,105 ක වෙනසක් පැවැතුණි. | 2024 වර්ෂයේ ගිණුම සැකසීමේදී නිවැරදි කරන බව. | ගිණුම් උපලේඛණ සමග ගලපා නිවැරදි කරගත යුතුය. |

## 1.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 373 | සියලුම අග්‍රිම දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් කෑගල්ල නගර සභාව විසින් 2013 ජූලි 08 දින ලබා දී තිබූ රු. 25,920 ක අත්තිකාරම 2023 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | පියවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුය. |
| ii. මුදල් රෙගුලාසි 571 | කෑගල්ල නගර සභාව මඟින් පවරා තිබූ එකතුව රු 9,871,826 ක කල් ඉකුත්වූ තැන්පතු නිරවුල් කර 211 නොතිබුණි | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | - එම - |
| (ආ) අංක 02/2020 හා 2020 අගෝස්තු 2 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සභාව විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළහැකි කාර්ය සාධක දර්ශක තුනක් හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) පළාත් පාලන චක්‍රලේඛ | | | |
| i. 2018 ජූලි 19 දිනැති අංක 2018/e පළාත් පාලන අංක 01 දරන චක්‍රලේඛය | අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබූ අතර ජනතාහිතවාදී සේවාවක් ලබාදීම සඳහා හා පොදු කාර්යාල පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් හඳුන්වාදී නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| ii. 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | වරිපනම් අයකිරීම සඳහා වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කලයුතු වුවද 2000 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දේපල තක්සේරුව සිදුකරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු 148,477,448 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාලව බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2023 දෙසැම්බර් 31 දිනට

| ආදායම් ප්‍රභවය | බිල්කල ආදායම | රැස්කළ ආදායම | මුළු හිගය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,054,482 | 5,746,037 | 5,590,343 |
| බදු කුලී | 55,788,296 | 55,343,185 | 5,379,087 |
| බලපත්‍ර ගාස්තු | 2,317,557 | 2,723,357 | 164,000 |
| වෙනත් ආදායම් | 134,678,300 | 75,889,116 | 35,727,904 |
| එකතුව | 200,838,635 | 139,701,695 | 46,861,334 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු<br>-----------------<br>සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාලව ලබා දී තිබුණු තොරතුරු අනුව අයවිය යුතු හිඟ වරිපනම් හා බදු ශේෂය රු.5,590,343ක් විය. වරිපනම් සඳහා භාවිතා කරන මෘදුකාංගය අනුව හිඟ වරිපනම් සඳහා අය කරන දඩ හා කාල විශ්ලේෂණය ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී සුදුසු පරිගණක මෘදුකාංගයක් ලබාගන්නා බව. | හිඟ බදු මුදල් අයකර ගත යුතු අතර දඩ හා කාල විශ්ලේෂණය පිළිබඳ තොරතුරු ලබාගත යුතුය. |
| (ආ) කුලී<br>----- | | |
| (i) කාලපරිච්ඡේදය අවසානයට අයවිය යුතු හිඟ කුලී ශේෂය රු.2,192,473 ක් වූ අතර වසර 02 ත් 05 ත් අතර කාලයක් වූ අයවිය යුතු ශේෂය රු.391,350 ක් හා වසර 05 ඉක්මවූ ශේෂය රු.765,110 ක් විය. | හිඟ ශේෂ අයකරමින් පවතින බව. | සභාව සතු ආදායම් කාලීනව අයකල යුතුය. |
| (ii) කාලපරිච්ඡේදය අවසානයට අයවිය යුතු හිඟ කඩකුලී දඩ ශේෂය රු.2,425,364 ක් වූ අතර වසර 05 ඉක්ම වූ ශේෂය රු.2,055,363 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ කඩකුලී දඩ අයකර ගත යුතුය.<br>හිඟ කුලී අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | තානායම් කුලී අයවිය යුතු ශේෂය රු.2,945,457 ක් වූ අතර ඒතුළ වසර 01 ත් 03 ත් අතර ශේෂය රු.2,443,431 ක් හා වසර 05 ට වැඩි ශේෂය රු.502,026 ක් විය. | නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවන ලෙස දැනුම්දී ඇති බව. | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බල ප්‍රදේශයේ කර්මාන්ත ඉදිකිරීමේ පරිපාලන වියදම් වෙනුවෙන් ප්‍රධාන අමාත්‍යාංශයෙන් 2017 ජනවාරි 25 දින ලැබී තිබූ රු.188,485 ක මුදල අදාල කාර්යයට නොයොදා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ජායා පිටපත් යන්ත්‍රයක් ලබා ගැනීමට තීරණය කර ඇති බව. | සුදුසු කාර්යයක යෙදවිය යුතුය. |
| (ආ) | කෑගල්ල නගර සභාවට අයත් බිම් කොටස් බදු දීම යටතේ ප්‍රැන්සිස් මොලමුරේ මාවතේ පිහිටි වරිපනම් අංක 303 හා 305 දරන පර්චස් 24.54 ක් විශාල ඉඩම ටෙන්ඩර් කිරීමකින් තොරව භාහිර පාර්ශ්වයකට 2006 වර්ෂයේ සිට අඛණ්ඩව බදු දී තිබූ අතර 2019 වර්ෂයෙන් පසුව බදුකරු සමඟ ගිවිසුමකට ඇතුලත් වී නොතිබූණි. එහෙත් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එකතුව රු.74,000 ක බදු මුදලක්ද ලබාගෙන තිබුණි. මෙම දේපලෙහි සභා අනුමැතියකින් තොරව හා පැවැති ගිවිසුමට පටහැනිව ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණත් මහ නගර සභාව විසින් 2024 සැප්තැම්බර් 30 විගණිත දිනය වන විටත් සන්තකය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතියෙන් තොරව ගොඩනැගිල්ල ඉදි කිරීම නිසා සන්තකය පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව සතු දේපල ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේදී කසල බදු අයකර ගෙන නොතිබුණි. | එක් ආදායම් පරීක්ෂකවරයෙක් පමණක් සිටින බැවින් මෙම කාර්යයට කාලය වෙන් කිරීම අපහසු බව. | සභාව සතු ආදායම් නියමිත පරිදි අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත කාල පරිච්ඡේදය තුල නගර ශාලාව වෙන් කිරීම සඳහා ලැබුණු රු.2,559,150 ක්, විනෝද බදු වෙනුවෙන් ලැබුණු රු.1,556,250 ක් හා මල් පෝච්චි හානිවීම් සඳහා අයකරගත් රු.120,000 ක මුදල් නිරවුල් කර ආදායමට ගැනීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් වර්ෂයට අදාල ආදායම් නිවැරදිව ගිණුම් ගත කල යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 ප්‍රකාරව ධාවන තත්ත්වයේ නොපවතින වාහන 17 ක් අපහරණය කිරීම හෝ අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට 2024 සැප්තැම්බර් 30 විගණිත දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | අපහරණ කටයුතු හා අළුත්වැඩියා කිරීම සිදු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8.1 වගන්තිය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකින්ම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කල යුතු වුවද වාහන 17 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. එම වාහන අතුරින් වාහන 15 ක මයිලෝ මීටර් අක්‍රිය වී ඇති බව නිරීක්ෂණය විය. | නව මයිලෝ මීටර් වෙළඳපොලේ නොමැති නිසා සවි කරගත නොහැකි වූ බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඕලගම පිහිණුම් තටාක ප්‍රේක්ෂකාගාරය හා කාර්යාල විවේකාගාරය II අදියර ඉදි කිරීමේ කර්මාන්තය සඳහා රු.මිලියන 14.98 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2019 ඔක්තෝබර් 28 දින භාහිර පාර්ශවයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි. එහෙත් 2024 සැප්තැම්බර් 09 විගණනය දිනය වන විට මේ සඳහා රු.18,571,534 ක වියදමක් දරා තිබුණත්, අත්‍යාවශ්‍ය වැඩ කොටස් නිමකර නොතිබීම නිසා ප්‍රයෝජනයට ගතහැකිව නොතිබුණි. එමෙන්ම පිහිණුම් තටාකයට සවිකර තිබූ රු.2,521,000 ක් වටිනා උපාංග වල 2024 සැප්තැම්බර් 09 විගණන දිනය වනවිට වගකීම් කාලය අවසන් වී තිබීම නිසා යන්ත්‍ර වල ඇති වන දෝෂයන් වගකීම් කාලය තුල ආවරණය කර ගැනීමට තිබූ අවස්ථාව මඟ හැරී තිබුණු අතර වටිනාකම රු.4,908,250 ක් වූ උපාංග | කර්මාන්තයේ වැඩ නිමකර මහජන ප්‍රයෝජනය සඳහා යෙදවීමට තීරණය වී ඇති බව. | මහජන දේපල ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

02 ක් සඳහා ලබාදී තිබූ වගකීම් කාලයෙන් විගණන දිනය වන විට වසර 01 මාස 06 ක් අවසන් වී තිබුණි. විගණිත අවස්ථාව වන විටත් එම ස්ථානය වල් බිහිවී තිබුණු අතර කර්මාන්තය සඳහා දරන ලද වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහාවූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 සැප්තැම්බර් 30 දිනදීය. | 2023 මාර්තු 20 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා මහා නගර සභාවට අදාලව ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස 2024 මැයි 28 දින දැණුවත් කරන ලදි. ඒ අනුව අදාල ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව. | ගිණුම් ඉදිරිපත් කිරීමේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |